# තණමල්විල ප්‍රාදේශීය සභාව

## මොණරාගල දිස්ත්‍රික්කය

-------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

---------------

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

--------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 24 වැනි දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 ජූලි 18 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2015 ජූලි 16 වැනි දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

1.2 **මතය**

---------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට තණමල්විල ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

-------------------------------------

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

----------------------

පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ) සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කර ගිණුම් ගත කිරිමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට කර්මාන්ත ණයගැතියන් රු. 26,974,952 ක් වුවද එය රු. 33,392,086 ක් සේ සලකා රු. 6,417,134 ක් වැඩියෙන් ගිණුම් ගතකර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු ආදායම රු. 1,186,533 ක් වුවද එය රු. 2,036,892 ක් සේ සලකා රු. 850,359 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

1.3..2 <u>නොසැසඳූ පාලන ගිණුම්</u>

ගිණුම් විෂයන් 08 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු. 126,617,680 ක් වූ අතර ශේෂ සහතික හා උපයෝගි ලේඛන අනුව ශේෂය රු. 98,082,326 ක් විය.

1.3.3 <u>ගෙවිය යුතු ගිණුම්</u>

වර්ෂ 1995 සිට 1999, 2001 සිට 2005, 2007, 2011 සිට 2012 යන වර්ෂයන් සඳහා රු. 269,061 ක විගණන ගාස්තු සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 02. <u>මූල්‍ය සමාලෝචනය</u>

### 2.1 <u>මූල්‍ය ප්‍රතිඵලය</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු3,663,013 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 2,980,122 ක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ ශුද්ධ වැඩිවීම. රු. 682,891 ක් විය.

## 2.2 <u>ආදායම් පරිපාලනය</u>

### 2.2.1 <u>හිඟ ආදායම්</u>

**සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.39,031,013 ක් වූ හිඟ ආදායම්1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 හා 159 වගන්තියේ විධිවිධාන අනුව අයකර ගෙන නොතිබුණි.**

### 2.2.2 බදු කුලි

--------

**(අ) පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන චක්‍රලේඛයේ විධිවිධාන අනුව සභාව සතු කඩ කාමර කුලි තක්සේරු කිරිමට කටයුතු කර නොතිබුණි.**

**(ආ)** තණමල්විල පොදු වැසිකිලිය , කිරි ඉබ්බන්වැව පැල තවාන භූමිය, ඩංඩුම ගවමස් කඩය සහ තණමල්විල ගවමස් කඩය යන සභා දේපල සමාලෝචිත වර්ෂයේදීද බදු දීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.3 වෙනත් ආදායම්

-----------------

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තියේ විධිවිධාන ප්‍රකාර 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යයක් සඳහා ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ ලියාපදිංචි කර ඇති හෝ එම අධිකාරිය අනුමත කර ඇති සභා බල ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන හෝටල් 01 ක් සහ ලැගුම්හල් 1 කින් අදාළ වර්ෂයට පෙර වර්ෂයේ ලැබීම් වලින් සියයට එක නොඉක්මවන ගාස්තුවක් අය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභා බල ප්‍රදේශයේ විවිධ සමාගම් ඉදිකර තිබූ සම්ප්‍රේෂණ කුළුණු 12 කින්1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තියේ විධිවිධාන අනුව වාර්ෂික බද්දක් අය කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.4 <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| උසාවි දඩ | 1,101,333 |
| මුද්දර ගාස්තු | 85,200 |

2.3 **අධිභාර**

1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 172 (3) වගන්තියේ විධි විධාන යටතේ වගකිව යුතු අයවළුන්ට එරෙහිව මා විසින් පනවන ලද අධිභාර අනුව 2014 දෙසැම්බර් 31 දිනට රු.672,220 ක මුදලක් අයකර ගැනීමට තිබුණි.

03. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

3.1.1 විදුලිබල අමාත්‍යාංශ ලේකම්ගේ 2010 අගෝස්තු 17 දිනැති ලිපියේ 2.1 වගන්තිය ප්‍රකාරව වීථි ලාම්පු ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරිම සඳහා ගාස්තු ගෙවීමේ පදනම මත පළාත් පාලන ආයතන වීථි පහන් ක්‍රියාත්මක කිරිම හා නඩත්තු කිරීම සඳහා සේවා සැපයුම් කරුවෙකු ලෙස කටයුතු කළ යුතු වුවත්, එසේ සිදු නොකර සමාලෝචිත වර්ෂයේදී සභා අරමුදලෙන් රු. 636,972 ක වියදම් දරා තිබු අතර වීථි ලාම්පු ස්ථාපනය කිරීමේදී ස්ථාපන ක්‍රමය සවිකළ යුතු ලාම්පු වර්ගය, සංඛ්‍යාව යනාදිය පිළිබඳව කටයුතු කර නොතිබුණි.

3.1.2 දේශිය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ 2014 සැප්තැම්බර් 29 දිනැති ආකෘති පත්‍ර අංක වැට් 41 ලිපිය අනුව එකතු කළ අගය මත බදු නොගෙවීම මත රු. 529,582 ක දණ්ඩනයන් ගෙවිමට සිදුවි තිබුණි.

3.1.3 2002,2005,2006,2007,2009,2013 හා 2014 වර්ෂවල සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලේ දායක මුදල් ගෙවීම ප්‍රමාද වීම මත සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ 2014 ඔක්තෝබර් 06 දිනැති ලිපිය අනුව රු. 16,678 ක අධිභාර මුදලක් ගෙවිමට සිදු වි තිබුණි.

3.1.4 සමාලෝචිත වර්ෂයේ අනියම් හා ආදේශක පදනම් යටතේ පුස්තකාල සහායක, පෙර පාසල් පාලිකා, තාක්ෂණික සහායක යන්ත්‍ර ක්‍රියාකරු, රියදුරු කාර්යාල කාර්ය සහායක, කම්කරු, මුරකරු යන තනතුරු සඳහා බඳවා ගෙන තිබූ සේවකයින් 20 දෙනෙකු සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් 24 දින ස්ථිර සේවයට පත් කර තිබූ අතර අනුමත කාර්ය මණ්ඩලයට ඇතුලත් වී නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ ඒ සඳහා වැටුප්, සේවක අර්ථ සාධක හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල් ලෙස රු. 4,130,714 ක් ගෙවා තිබුණි.

3.2 <u>අවිධිමත් ගනුදෙනු</u>

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19 (1)(i) වගන්තියේ විධිවිධාන අනුව පළාත් පාලන කොමසාරිස්ගේ ලිඛිත පූර්ව අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේදී විවිධ තනතුරු සඳහා සේවකයින් 11 ක් බඳවාගෙන වැටුප්, සේවක අර්ථ සාධක සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් ලෙස රු. 649,904 ක් ගෙවා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ XIV පරිච්ඡේදයේ 4 වගන්තියේ හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන වලට පටහැනිව සභාවේ රැස්වීම්වලට පැමිණීම වෙනුවෙන් සංයුක්ත දීමනා වශයෙන් මන්ත්‍රීවරුන් 16 දෙනෙකු වෙනුවෙන් රු. 67,440 ක් ගෙවා තිබුණි.

## 04. <u>පද්ධති හා පාලනය</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය

(ආ) අභ්‍යන්තර පාලනය

(ඇ) ආදායම් පරිපාලනය